




# ටිගෝ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන රට පුරා විහිදේ

**පාරිභෝගික** පහසුකම් වර්ධනය කිරීමේ අදහසින් ටිගෝ සමාගම තම පාරිභෝගිකයන්ට මනා සේවයක් ලබාදීම පිණිස වඩා පුළුල් පාරිභෝගික මධ්‍යස්ථාන ගණනක් තෝරා ගත් IOC පිරවුම්හල් හා ලාෆ්ස් සුපිරි වෙළෙඳ සල්වල පිහිටුවා ඇත.

මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ටීගෝ පාරිභෝගිකයන්ට ගමන් බිමන්වල යෙදෙන අතරතුර ඉතා පහසුවෙන් සේවා ලබාදීමය. එහිදී ඉන්ධන පිරවුම්හල් හා සුපිරි වෙළෙඳ සල් පාරිභෝගිකයින් රැස්වන ප්‍රධාන ස්ථානයන් 2ක් ලෙස ටිගෝ විසින් හඳුනාගෙන ඇත.

අලුතින්ම හඳුන්වා දුන් Shop in Shop සංකල්පය අන්තර්ජාලය හරහාද සේවා සැපයෙනු ඇත. බිල් ගෙවීම්, පෙරගෙවුම් හා පසුගෙවුම් සිම්පත් අලෙවිය, Scratch Card සහ රීලෝඩ්, Handsets හා විශේෂ අමතර සේවා මීට අයත්ය. ඉහත සඳහන් සේවාවන්ට අමතරව ඉන් එක් සේවා මධ්‍යස්ථානයක පහත සඳහන් ගනුදෙනු කිරීමේ හැකියාවද පවතී.

* දුරකථන අංකය වෙනස් කිරීම
* IMI වෙනස් කිරීම

ජංගම දුරකථන හා සිම් අක්‍රිය කිරීම

ස්ක්‍රැච් කාඩ්/E Pin සම්බන්ධ ගැටලු

දෙවැනි සිම් පතක් ලබාගැනීම (නැතිවූ/නාස්ති වූ)

ජංගම දුරකථන කාඩ්පත් ඉල්ලුම් පත්‍ර

සංක්‍රමණ සිම්පත් ලබාගැනීම (Migration Sim )

නව සිම් අලෙවිය - පසුගෙවුම් හා පෙර ගෙවුම්

මෙම සේවාවන් කොහුවල, මොරටුව සහ මහරගම යනා දී ප්‍රදේශවල ඇති ලාෆ්ස් සන්-අප් සුපිරි වෙළෙඳසල්වලින් ලබාගත හැකි අතර, දෙමටගොඩ, හැව්ලොක්ටවුන් සහ බම්බලපිටිය ප්‍රදේශවල ඇති IOC ඉන්ධන පිරවුම් හල්වලින්ද ලබාගත හැක.

මෙම මධ්‍යස්ථානවල අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින්, මෙයින්ද පාරිභෝගිකයින්ට අමතර වාසිද හිමිවේ.